ResearchGate

See discussions, stats, and author profiles for this publication at: https://www.researchgate.net/publication/377186984

# Religious harmony that reveals from the inscriptions at Budumuttāva

**Article** · January 2024

CITATIONS
0

READS
8

1 author:

Nadeesha Gunawardana
University of Kelaniya

**28** PUBLICATIONS **9** CITATIONS

SEE PROFILE

All content following this page was uploaded by Nadeesha Gunawardana on 06 January 2024.

The user has requested enhancement of the downloaded file.

Gunawardana Nadeesha (2023) “Religious harmony that reveals from the inscriptions at Budumuttāva", (in Sinhala), Bōmaluwa, vol. 01, issue 03, ISSN 2706-0101, pp.75-78, Nethvin Printers, Peradeniya.

# සිංහල හා දෙමළ ජාතික සහජීවනයේ අගය පවසන බුදුමුත්තාව දෙමළ සෙල්ලිපි

නදීෂා ෂර්මලී ගුණවර්ධන, ඉතිහාස අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

සමන් බන්දු හේරත්, ඉතිහාස අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

## හැඳින්වීම

ක්‍රි.ව 1017 සිට ක්‍රි.ව 1070 දක්වා රක්ඛපාෂාණඛණ්ඩ හෙවත් රක්වාණ සීමා කොට පැවති සොළී පාලනය කරණකොටගෙන විශේෂයෙන් රජරට ප්‍රදේශයෙහි ද්‍රවිඩ බලය සීඝ්‍රයෙන් ව්‍යාප්ත වූ බව නොරහසකි. ක්‍රි.ව. 1070 දී දකුණු ඉන්දියාවේ පළමුවන වන කුලෝත්තුංග දවස පළමුවන විජයබාහු, රජරටින් සොළීන් පලවා හැර දීප සක්විති විය. එහෙත් මේ වන විට රජරට ස්ථිර නිවාස ග්‍රහණය කරගෙන සැලකිය යුතු ද්‍රවිඩ ජනගහණයක් සිටි බවට සාධක තිබේ. සොළී පාලන සමය තුළ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ විල්ගම් විහාරය නවීකරණය කළ සොළීහු, එයට "රාජරාජ පෙරුම්පල්ලි" යන නාමය දුන්හ. ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ තිරියාය (ගිරිහඬු සෑය) මේ කාලයේ දී "නාථනාර් කෝවිල" නමින් හැඳින්විණි. දීප සක්විති වීමෙන් පසු ඇති වූ වේළයික්කාර කැරැල්ල මැඩපවත්වා ඔවුන් විශ්වාසවන්තව තබා ගැනීමේ දේශපාලන උපායක් ලෙස ඔවුන්ට දළදා වහන්සේගේ භාරකාරත්වය පැවරීමට පළමුවැනි විජයබාහු රජුට සිදු වී තිබේ. ක්‍රි.ව. 1111 දී පළමුවන වන විජයබාහුගේ අභාවයෙන් පසු ඒකීය ශ්‍රී ලංකාව දේශපාලන ඒකක හතරකට බෙදී පැවතිණි. ක්‍රි.ව. 1111 සිට ක්‍රි.ව. 1153 අතර කාලයේ රජරට දක්ඛිණ දේශය, අටදහස් රට, දොළොස්දහස් රට යනුවෙන් දේශපාලන ඒකක චතුෂ්කයකට ශ්‍රී ලංකාව බෙදී පැවතිණි. අනුරාධපුර යුගයේ අවසාන භාගයේ හා පොළොන්නරු යුගයේ ආරම්භ අවදියේ විශේෂයෙන් රජරට ප්‍රදේශයේ සමාජ සහ සංස්කෘතික පසුබිම නිරීක්ෂණයට අදාළ වන අභිලේඛන අතර බුදුමුත්තාව සෙල් ලිපි තුන අතිශයින් වැදගත් ප්‍රාථමික මූලාශ්‍රයෝ වෙති. ඒවා මධ්‍යතන ශ්‍රී ලංකාවේ ද්‍රවිඩ ආභාසය හෙළි කරන ප්‍රබල සන්නිවේදන මාධ්‍යයක්ව පවතී.

## පිහිටි ස්ථානය

බුදුමුත්තාව කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් ප්‍රදේශයකි. නිකවැරටිය ප්‍රදේශයට සැතපුමක් පමණ වයඹ දෙසින් බුදුමුත්තාව ග්‍රාමය පිහිටා ඇත. එහි මහනුවර යුගය නියෝජනය කරන මෑත කාලීන වරිච්චියෙන් නිමවන ලද විහාර පරිශ්‍රයක් ද වේ. එය පැරණි ගොඩනැගිලි නටබුන්වලින් ශේෂව ඇති ගල්කණු යොදා ඉදිකරන ලද්දකැයි සැලකේ. මෙහි ද්‍රවිඩ බසින් රචිත අභිලේඛන ත්‍රිත්වයක් දක්නට ලැබේ. එනම්, ඉහත සඳහන්කරන ලද පැරණි ගල් කණු දෙකක දෙමළ ශිලා ලිපි දෙකක් ද, බෝමළුව අසල තවත්

දෙමළ බසින් රචිත ශිලාලිපියක් ද දක්නට ලැබේ. මෙම පර්යේෂණ පත්‍රිකාවෙහි අප දෙදෙනාගේ අවධානයට යොමුවනුයේ, ඉහත කී ද්‍රවිඩ ශිලාලිපි ත්‍රිත්වයයි. මෙම ලිපි ත්‍රිත්වය වරින්වර උගතුන්ගේ අවධානයට යොමුවී ඇති බව මෙහිදී සඳහන් කළ යුතුවේ. මේ කාලය වන විට කුරුණෑගල දිස්ත්‍රික්කයෙහි බුදුමුත්තාව, මාගල වැනි ප්‍රදේශ ද්‍රවිඩ ජනතාව බහුලව නිවාසග්‍රහනය කළ ස්ථාන ලෙස ඉහත සෙල්ලිපි අධ්‍යයනයේදී තහවුරුවේ.

**සෙල්ලිපි සොයා ගැනීම**

ප්‍රථමයෙන්ම මෙම සෙල්ලිපි තුන පිළිබඳව අනාවරණය කරන ලද්දේ Ancient Inscription of Ceylon නම් කෘතියෙහි ඊ. මුලර් මහතා විසිනි.[1] නමුත් එහි මෙම සෙල්ලිපි ත්‍රිත්වය පිළිබඳ පැහැදිළි විස්තරයක් අන්තර්ගත නොවීය. ඉන් පසුව මෙම සෙල්ලිපි පිළිබඳව Archaeological Survey of Ceylon, Annual report 1911-1912 හි[2] එච්. සී. පී. බෙල් මහතා අවධානයට ලක්කොට ඇත. පසුව The Ceylon Journal of Science[3] හි හා Epigraphia Zeylanica vol. iii[4] හි සෙනරත් පරණවිතාන මහතා විසින් දෙමළ සෙල්ලිපි දෙක පිළිබඳව කරුණු දක්වා ඇත.

**බුදුමුත්තාව පළමු වන ද්‍රවිඩ ශිලාලේඛනය**

පළමු වන බුදුමුත්තාව ද්‍රවිඩ ලිපිය හෙළි කරන ශිලාමේඝ චක්‍රවර්ති වූ ශ්‍රී ජයබාහු රජු ගේ අට වන වර්ෂයෙහි මැදින් මස පූර්ව පක්ෂයේ චතුෂ් වන දිනයෙහි (යාණ්ඩු චට්ටාවදු පංගුනි මුන්නාලම් පක්කම්) ශ්‍රී වීරබාහු දේවගේ පංච ප්‍රධානයන් (ශ්‍රී වීරබාහු දේවර් පංච ප්‍රධානිගල්) පූර්ව චාරිත්‍ර මාර්ගය නිරීක්ෂණය කොට වන්නාර්වරුන් හෙවත් රජකයන් සේවා කඩ කරන බව දැන ඔවුන් ලවා ඒ සේවා කරලීමට පනවන ලද ආඥාවක් මේ ලිපියෙහි දැක්වේ. මැදඋයන්ගොඩ විමලකීර්ති හිමියන් පවසන්නේ "මේ ලිපියෙහි එන ජයබාහුදේව අන්‍යයෙකු නොව මහලු විජයබාහුගේ සහෝදරයා සේ ගණින් ගත යුතුය" යන්නය.[5]

පෙර සිරිතට අනුව රජකයන් විසින් කම්මාලර් ගෝත්‍රිකයන්ට කොටහලුව (වැඩිවියට පත් ළඳුන්ට ඇඳීමට දෙන වස්ත්‍රය) හා පාවාඩ ද මළවුන් ගේ මුව වසන වස්ත්‍ර ද දීම සිදු කිරීම වගකීමක් ලෙස ඉටු කළ ද, මේ කාලය වන විට ඒ සිරිතෙන් ඔවුන් බැහැරව සිටීම නිසා මේ ලිපිය සැලසුම් කිරීමට සිදු වූ බව පෙනී යයි. වීරබාහු දේව ප්‍රාදේශික පාලකයාට යළි මේ සිරිත පුනස්ථාපනය කරනු සඳහා බුදුමුත්තාව පළමු වන සෙල්ලිපිය සකස් කිරීමට සිදු වී තිබේ. කොටහලු ද, පාවාඩ ද, මළමිනි මුව වසන රෙදි දීම යළි

---

[1] Muller. E (1883), ***Ancient Inscription of Ceylon***, London: p.60.
[2] Bell. H.C.P (1915), ***Archaeological Survey of Ceylon***, Annual report 1911-1912, Colombo, p.115.
[3] Hocart A. M and Paranavitana. S (1933), ***The Ceylon Journal of Science,*** vol. II ed. Colombo, p. 117.
[4] Paranavitana. S (1933) (edited), *Epigraphia Zeylanica*, vol. iii, Humphrey Milford Oxford University Press, Amen House, E.C., pp. 302-312.
[5] මැදඋයන්ගොඩ විමලකීර්ති (1958), ශිලාලේඛන සංග්‍රහය, වෙළුම III, ඩී. පී. දොඩන්ගොඩ සහ සමාගම, පි. 198.

නොකඩවා පවත්වන්ට නියම කරන මේ ලිපිය කල්පාන්තරයක් තෙක් (යුගාන්දමේ අලවුම්) පවත්වන්නට (නිර්පදාහ) නිර්දේශ කර තිබේ.

මේ ලිපිය හෙළි කරන පරිදි වීරබාහු දේවයන්ගේ ප්‍රධානයන් කළ නිරීක්ෂණයකින් තදනන්තරව මේ ලිපිය සැලසුම් කර තිබේ. පංච ප්‍රධානයෝ වනාහි රජුන්ට රාජ්‍ය සූත්‍රය පවත්වා ගැනීමේ දී අනුශාසනා දුන් ඉහළ පෙළේ ප්‍රභූවරු වූහ. සේනාපති, භාණ්ඩාගාරික, ලේකම්, ඈපා (ආදිපාද) මාපා (මහාදිපාද) යන පංච පුද්ගලයන් ඊට අයත් විය.[6] මේ ලිපියේ ඔවුහු පංච ප්‍රධානිගල් ලෙස හැඳින්වෙති. සේනාපති ප්‍රමුඛ පංච ප්‍රධානයන් විසින් මෙහිදී පෙර සිරිත පරීක්ෂාකොට ඇත. මේ ලිපිය පිහිටුවන ලද්දේ මාක්කලිංගම් කණවඩි, දාමාරන් හොරුවෙහී කාශම් බණ්ඩාරත්තුළ් හා විජයාබරණ යන ද්‍රවිඩ නිලධාරීන් විසිනි. මෙම ලිපිය පිහිටුවීමට පෙර සිරිත පරීක්ෂා කොට ඇත්තේ රාජ සභාවේ සිටි පංච ප්‍රධානීන්ය. මොවුන් බොහෝවිට සිංහල ජනයා විය හැකිය. නමුත් ලිපිය ස්ථාපනය සිදුකරනු ලබන්නේ ද්‍රවිඩ පුද්ගලයින් තිදෙනෙක් විසිනි. ඔවුන්ගේ නම් ශිලාලේඛනයේ සඳහන් වීමෙන් මේ බව සැකයකින් තොරවම හඳුනාගත හැකිවේ. මෙම සෙල්ලිපියෙහි අඩංගු නීතිමය කරුණ සම්පාදනයට සිංහලයන්ගේ මැදිහත්වීම ද එය ස්ථාපනය කිරීමට ද්‍රවිඩයන්ගේ මැදිහත්වීම ද සුසංයෝග වූ බව ගම්‍යවේ. මෙහිදී සඳහන් කළ යුතු තවත් කරුණක් වන්නේ ලිපි ලේඛන සම්පාදනයේදී ද්‍රවිඩ ජනයාගේ මැදිහත්වීම මේ කාලය වන විට සැලකිය යුතු අන්දමින් ඉහළ ගොස්ඇති බවය. මේ බව පනාකඩුව තඹ සන්නසින් ද විද්‍යමානය.[7] එහි

"කැත්තෙහි අව සතවක් දවස් පිවින් මත්තෙහි මෙ වැ (ව) ස්ථා කළ බවට

දෙමළලෙය් දරු පොතැ අත්වර ලියන දෙවමි."[8]

මෙහි "දෙමළලෙය් දරු" යනුවෙන් සඳහන් වන්නේ දෙමළ ලේකම්වරයෙකු පිළිබඳවය. සොළී බලය මර්ධනය කිරීමට නන් අයුරින් උපකාරීකළ බුදල්නාවන් හෙවත් බුද්ධරාජට පිරිනමන ලද වරප්‍රසාද ලියා තැබූයේ ද්‍රවිඩ ලේඛකයාගේ පොතෙහිය. බුදුමුත්තාව ප්‍රථම ද්‍රවිඩ සෙල්ලිපියෙහි නීති සම්පදානය කරනුයේ සිංහලයන් විසින් වුවත් එය කෙටුම්පත් කොට ඇත්තේ ද්‍රවිඩයන් විසිනි. 11 වන සියවසින් පසු කාලය වන විට නීති සම්පාදනය කොට ස්ථාපනය කිරීමේ කාර්යයයේදී සිංහල, ද්‍රවිඩ යන දෙකොට්ඨාසයම එකතු වූ බව පෙනේ. ජාතික සමගියේ අගය පෙන්වන කැඩපතක් ලෙස මෙම බුදුමුත්තාව පළමු සෙල්ලිපිය පෙන්වා දිය හැකිය.

මෙකල පවැති දේශපාලන මුහුණුවර දෙස බලන කළ වසර 53කට අසන්න කාලයක් චෝළ ආධිපත්‍යට ලංකාව ගොදුරුව පැවතිණි. දැවැන්ත සටනක් කොට පළමු වන විජයබාහු රජු සොළී බලය මර්ධනයකළත්, ඉන් පසුව උදාවන කාලය තුළ සිංහල හා ද්‍රවිඩ ජනයා ඉතාමත් සහයෝගයෙන් කටුයතු කළ බවට සාදක රාශියක් දක්නට ලැබෙන අතර ඉහත සඳහන් වනුයේ එයින් එක් අවස්ථාවක් පමණි.

---

[6] එම.

[7] Paranavitana. S & Godakumbura. C. E (1965) (edited), ***Epigraphia Zeylanica***, vol. v, Government press Ceylon, pp. 1-26.

[8] අමරවංශ හිමි කොත්මලේ (2017), ***ලක්දිව සෙල්ලිපි,*** ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන, පි. 345

**බුදුමුත්තාව දෙවන ද්‍රවිඩ ශිලාලේඛනය**

බුදුමුත්තාව දෙවන ද්‍රවිඩ සෙල් ලිපිය ද අතිශයින් වැදගත් වන අතර, මෙය ගල් කණුවක කොටා ඇත. එය තත්කාලීන සංස්කෘතික ජීවිතයේ ඒක දේශයක් කැටපත් කරන්නකි. පොළොන්නරු කාලය වන විට ලංකාවේ රාෂ්ට්‍ර පාලකයන් දේශපාලන බල සමතුලිතතාව සඳහා දකුණු ඉන්දීය පාණ්ඩ්‍ය හා ඇතැම් විට චෝළ රාජවංශික කුමාරිකාවන් ආවාහ කරගෙන සිටිනු දක්නට ලැබේ. බුදුමුත්තාව දෙවන ලිපියේ දැක්වෙන වීරප්පෙරුමාල් පොළොන්නරු මහ පැරකුම්ගේ පියතුමන් වන වීරබාහු, ආදිපාද විය හැකි යැයි මැදඋයන්ගොඩ විමලකිත්ති හිමියන් සැකකරයි.[9] ශිලාලිපියෙහි සඳහන් වීරප්පෙරුමල් යම් හෙයකින් පැරකුම්ගේ පියතුමා වුවහොත්, නම් ඔහු ආවාහ කරගෙන සිටියේ චෝළ පළමුවන කුලෝත්තුංග රජුගේ දුවක වන (කොලොත්තුංග දොළ දේවර් තිරුමගලාර්) "චුන් දවල්ලියාර්වාර්" නම් රජ කුමරිය බව මේ ලිපිය පවසයි. ඇය විසින් මාගල හෙවත් වික්‍රමශීලාමේඝ පුරයෙහි ඊශ්වර කෝවිලේ දේව පූජාව උදෙසා ඉර හඳ පවතින තුරු (චන්දිරාදිත්තවර් නින්රු) දල්වනු සඳහා (එරිය ඉට්ට) නොනිවෙන දොළොස් මහ පහනක් තබන ලද බව මෙහි කියැවේ. ඒ පහන තඹ පහනක් වූ බව ද දැක්වේ. බුදුමුත්තාව ද්‍රවිඩ සෙල්ලිපිවලට සමකාලීන නාථනාර් (තිරියාය - නිතුපත්තපාණ) හා රාජරාජ පෙරුම්පල්ලි කෝවිලේ (විහාර) පරිශ්‍රයේ ඇති සෙල්ලිපි සමග එක් ව සලකන විට 12 වන සියවස විශේෂයෙන් හින්දු සමාජ චාරිත්‍ර මෙන් ම ශෛව වන්දනය ද ලාංකික සමාජයට පිවිස ගෙන සංස්කෘතික මිශ්‍රණයක් ඇති වූ යුගයක් ඉතිහාසඥයාට ගෝචර කරවන්නේය.

**බුදුමුත්තාව තෙවන ද්‍රවිඩ ශිලාලේඛනය**

මෙය ඍජුකෝණාශ්‍රාකාර ගල් පුවරුවක කොටා ඇත. මෙම ලිපිය මෙම ස්ථානයට රැගෙන විත් ඇත්තේ විහාරස්ථානයට යාර 400කට පමණ නුදුරින් පැවති පොල්වත්තකිනි. මෙම ලිපිය පිළිබඳව සෙනරත් පරණවිතාන මහතා සඳහන් කර ඇතත් එහි අන්තර්ගතය ප්‍රකාශයට පත් කොට නොමැත.[10] ඒ. වේලුපිලෙයි මහතා මෙම ලිපියෙහි අන්තර්ගතය ප්‍රකාශයට පත්කිරීමට උත්සහ කළ නමුදු ඔහුගේ ප්‍රයත්නය ද අසාර්ථක වී ඇත.[11] මෙම ශිලාලේඛනය කියවා ප්‍රකාශයට පත්කිරීමේ ගෞරවය හිමිවනුයේ එස්. පත්මනාතන් මහතාටය.[12] මෙම සෙල්ලිපිය ඇතුළත් ගල් පුවරුව විවිධ කටයුතු සඳහා භාවිතා කිරීම හේතු කොටගෙන වැදගත් කරුණු අන්තර්ගතව තිබුණේ යැයි සිතියහැකි කොටස් විනාශවී ගොස් ඇත.

---

[9] මැදඋයන්ගොඩ විමලකීර්ති (1958), පි. 202.
[10] Paranavitana. S (1933), p. 302.
[11] Velupillai. A (1987), "A note on a Fragmentary inscription of the Virokkoti From Budumuttava", ***Journal of Tamil Studies,*** International institute of Tamil Studies, Madras, p. 57-65.
[12] Pathmanathan. S (1994), "The Tamil Slab inscription of the Virakkoti at Budumuttava, Nikaweratiya urbanization at Magala", ***The Sri Lankan journal of the humanities***, pp.15-30.

මෙහි අන්තර්ගතවනුයේ නානාදේසීන් නමින් වූ වෙළඳ කණ්ඩායමක් පිළිබඳව වූ ප්‍රශස්තියක්වේ. නානාදේසීන් විසින් ලංකාව තුළ පිහිටුවන ලද දීර්ඝ සෙල්ලිපි අතරින් එකක් ලෙස මෙය සැලකිය හැකිය. මෙම සෙල්ලිපියේ "අඤ්ඤූර්රුවන්පළ්ළි" යනුවෙන් හඳුන්වා ඇත්තේ මෙම විහාරස්ථානය විය හැකිය. මෙම විහාරස්ථානය "අඤ්ඤූර්රුවර්" නමින් හැඳින්වෙන වෙළඳ කණ්ඩායමක් අනුග්‍රහය දක්වා ඇති බව පෙනේ. එසේම "වීරක්කොටෙ" නම් වූ පිරිස මුදල් හා පහන් පරිත්‍යාග කොට ඇත. එසේම ඔවුන් සංඝයා අතර ගැටලු නොකරගන්නා ලෙස ඉල්ලීමක්ද කොට ඇත. "වීරක්කොටෙ" නමින් හැඳින්වූ මෙම පිරිස නානාදේසීන්ට සම්බන්ධ පිරිසකි.[13] "වීරක්කොටෙ" හෝ "වීරක්කොටෙයාර්" යනු එකොළොස්වන සියවෙස් ලංකාවේ සිටි තවත් වෙළඳ කණ්ඩායමක් බව මේ සම්බන්ධයෙන් ඇති තවත් මතයකි.[14] මෙම ශිලාලිපිය අධ්‍යයනයක යෙදෙන එස් පත්මනාතන් මහතා ප්‍රකාශ කරන්නේ මොවුන් යුධ භටයන් කණ්ඩායමක් වියහැකි බවය.[15] මෙම සෙල්ලිපියෙහි පහළ කොටසේ යුද කොපුවක් ද, මුදල් පසුම්බියක් ද, දිග පිහියක් ද, දුන්නක් හා ඊතලයක් ද, වකගැසුණු කඩුවක්ද යනාදී වූ ආයුධ කිහිපයක සටහන් දක්නට ලැබේ. එස්. පත්මනාතන් මහතා

> "The last but by no means the least important considerations the fact that it contains the representations of the figures of a number of weapons depicted in a manner not found elsewhere in Sri Lanka and also probably not even in South India."

යනුවෙන් මෙම ලිපියෙහි අන්තර්ගත ආයුධ ප්‍රමාණය ඇතුළත් සෙල්ලිපියක් දකුණු ඉන්දියාවෙන් පවා හමුනොවන බව ප්‍රකාශ කරයි. සෙල්ලිපියෙහි අන්තර්ගත කරුණු අනුව පෙනී යන්නේ මාගල පිහිටි විහාරස්ථානයට ද්‍රවිඩ වෙළඳ කණ්ඩායමක් හා ද්‍රවිඩ යුධභට පිරිසක් විසින් ද අනුග්‍රහය දැක් වූ බවය.

**වාග්විද්‍යාත්මක වැදගත්කම**

තව ද බුදුමුත්තාව ද්‍රවිඩ සෙල් ලිපි වාග් විද්‍යාත්මක දෘෂ්ටියකින් සලකන විට ද අතිශයින් වැදගත් වේ. පළමු වන බුදුමුත්තාව ද්‍රවිඩ සෙල්ලිපිය ආරම්භ වනුයේ "ස්වස්ති" යන සංස්කෘත පදයෙනි. දෙවැන්න ආරම්භවන්නේ "ශ්‍රී ජය" යන සංස්කෘත පදයෙනි. තව ද එහි සංස්කෘත පද ද්‍රවිඩ උරුවට හරවා යොදන ලද ස්ථාන ද වේ. "යුගාන්දරම්", "පංචප්‍රධානිගල්" යන යෙදුම් මීට සාක්ෂ්‍ය දරයි. තවද මෙහි පාවඩ යන සිංහල උක්තිය ද්‍රවිඩ උච්චාරණ ඌරුවට අනුවර්තනය කර "පවාඩෛයමු" ලෙස භාවිත කර තිබේ. තව ද "කොටහලුව" යන සියබසේ උක්තිය "කොට්ටවළුවුත්ථ" ලෙස යොදා තිබේ. මිශ්‍ර සිංහලය දැඩිව

---

[13] Ibid, p.24.

[14] Indapala. K 1970, "Some medieval Mercantile communities of South India and Ceylon", Journal of Tamil Studies, Vol II, no 2, ***International Institute of Tamil Studies***, Madras, pp.1-15.

[15] Pathmanathan. S (1994), p.25.

බලපවත්වන ලද පොළොන්නරු කාලයේ දී ද්‍රවිඩ වචන ද රාශියක් සිංහලයට පිවිස ගෙන තිබිණි. බුදුමුත්තාව දෙවන ලිපියෙහි වික්‍රම යන පදය යොදා ඇත්තේ "වික්කිරම" ලෙසිනි. ද්‍රවිඩ ආභාසයෙන් සිංහල වාක් කෝෂය පෝෂණය වීමේ පැහැදිලි ආරම්භයක් මේ යුගයෙන් පසු දැකීමට ද බුදුමුත්තාව දෙමළ සෙල් ලිපි ආධාර වේ.

**නිගමනය**

ක්‍රි:ව 4 වන සියවසේ සිටම මෙම ප්‍රදේශය කෘෂිකාර්මිකව දියුණුව පැවති බව මහසෙන් රජු විසින් ඉදිකරන ලද මහාගල්ල වැවෙන් පැහැදිළිවේ.[16] මේ අනුව අපට පෙනී යන්නේ මාගල ප්‍රදේශය එකොළොස්වන හා දොළොස්වන සියවස්වන විට ඉතා දියුණු නගරයක් වන්නට ඇති බවය. නීතසම්පාදනයේ හා කෙටිම්පත් කිරීමේදී සිංහල දෙමළ දෙපිරිසම එක්ව කටයුතු කළ බව පෙන්වාදිය හැකිය. ජාතීන් අතර විවාහ සබඳතා ගොඩනැගී තිබූ අතර මෙම ලිපි තුළින් කැටපත්වන ආගමික සහජීවනය අගය කළ යුතු තවත් කරුණකි. බුදුමුත්තාව විහාර පරිශ්‍රයේ ඇති මේ ද්‍රවිඩ සෙල් ලිපි ත්‍රිත්වය නිහඬව සිටිමින් මධ්‍යතන යුගයේ සමාජ, සංස්කෘතික හා භාෂා ඉතිහාසයේ සැඟවුණු කොන් අපට ජීවමානව සන්නිවේදනය කරයි. තව ද එක ම රක්තවර්ණ රුධිරය සිරුරේ දිව යන ද්‍රවිඩ සිංහලාදී හැම ජාතිකයෙකුටම එකම දම්වැලක පුරුක් ලෙසින් අභින්නව සමාජයේ සහජීවනයෙන් ජීවත් වීමට උදාර පාඩමක් මේ බුදුමුත්තාව ද්‍රවිඩ ලිපි අපට ලබා දෙයි.

**ආශ්‍රිත මූලාශ්‍රය**


Bell. H.C.P (1915), ***Archaeological Survey of Ceylon***, Annual report 1911-1912, Colombo, p.115.

Hocart A. M and Paranavitana. S (1933), ***The Ceylon Journal of Science,*** vol. II ed. Colombo, p. 117.

Indapala. K (1970), "Some medieval Mercantile communities of South India and Ceylon", Journal of Tamil Studies, Vol II, no 2, ***International Institute of Tamil Studies***, Madras, pp.1-15.

Mahāvaṃsa (1964), (trans.) Wilehlm Giger, London, 37:49.

Muller. E (1883), ***Ancient Inscription of Ceylon***, London: p.60.

Paranavitana. S (1933) (edited), ***Epigraphia Zeylanica***, vol. iii, Humphrey Milford Oxford University Press, Amen House, E.C., pp. 302-312.


[16] Mahāvaṃsa (1964), (trans.) Wilehlm Giger, London, 37:49.

Paranavitana. S & Godakumbura. C. E (1965) (edited), ***Epigraphia Zeylanica***, vol. v, Government press Ceylon, pp. 1-26.

Pathmanathan. S (1994), "The Tamil Slab inscription of the Virakkoti at Budumuttava, Nikaweratiya urbanization at Magala" ***The Sri Lankan journal of the humanities***, pp.15-30.

Velupillai. A (1987), "A note on a Fragmentary inscription of the Virokkoti From Budumuttava", ***Journal of Tamil Studies,*** International institute of Tamil Studies, Madras, p. 57-65.

අමරවංශ හිමි කොත්මලේ (2017), ***ලක්දිව සෙල්ලිපි,*** ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන, පි. 345

මැදඋයන්ගොඩ විමලකීර්ති (1958), ***ශිලාලේඛන සංග්‍රහය, වෙළුම III***, ඩී. පී. දොඩන්ගොඩ සහ සමාගම, පි. 198.



View publication stats